# කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය 1 | කාලය පැය 0 1 යි

**විභාග අංකය ඃ ............................ පන්තිය ඃ .......................**

---

*** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

මෝස්තර නිර්මාණ ශිල්පියෙකු වූ සාගර ඇඳුම් මැසීම පිළිබඳ වසර ගණනාවක පළපුරුද්දක් ඇති තම සහෝදරිය වන සාගරිකා සමඟ එක් වී 'ලක් සළු' නමින් ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් හික්කඩුව සංචාරක හෝටල් අසල ගොඩනැගිල්ලක් කුලියට ගෙන ආරම්භ කරන ලදී.

(01) මෙම සිද්ධියේ සඳහන් 'ලක් සළු' ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?

(01) ආහාර (02) ඇඳුම් (03) සළුපිළි (04) හෝටල්

(02) ඉහත සිද්ධියේ සඳහන් 'ලක් සළු' ව්‍යාපාරයේ අවස්ථාවක් වන්නේ,

(01) සාගර මෝස්තර නිර්මාණ ශිල්පියෙකු වීම ය.
(02) සාගරිකා වසර ගණනාවක ලබා ඇති පළපුරුද්ද ය.
(03) ව්‍යාපාරය සංචාරක හෝටල් අසල පිහිටා තිබීම ය.
(04) ව්‍යාපාරය දෙදෙනෙකු එකතු වී ආරම්භ කිරීම ය.

(03) ඉහත සිද්ධිය සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - මෙය පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි. B - මෙය වගකීම සීමිත වූ ව්‍යාපාරයකි.
C - මෙය ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයකි. D - මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(01) A , B හා C ය. (02) A , B හා D ය. (03) A , C හා D ය. (04) ඉහත සියල්ලම ය.

(04) මෙම සිද්ධියේ සඳහන් 'ලක් සළු' ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(01) ඒක පුද්ගල ව්‍යාපාර ය. (02) හවුල් ව්‍යාපාර ය.
(03) සීමිත සමාගම් ය. (04) සමිති ව්‍යාපාර ය.

(05) ව්‍යාපාරයක් යනු

(01) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන ඕනෑම ආර්ථික කටයුත්තකි.
(02) සිල්ලර හෝ තොග වෙළඳසලකි.
(03) භාණ්ඩ හා සේවා හුවමාරු කරන ස්ථානයකි.
(04) ලාභ ලැබීමේ අරමුණෙන් කරන ඕනෑම කටයුත්තකි.

(06) ව්‍යාපාර පරිසරයේ සිදු වූ සිදුවීම් කීපයක් පහත දැක්වේ.

A - යටිතල පහසුකම් දියුණු කිරීම. B - ඉන්ධන මිල ඉහළ දැමීම.
C - ආනයනික අර්තාපල් අල සඳහා බද්දක් පැනවීම.

ඉහත සිදුවීම් අතුරෙන් ආර්ථික පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(01) A හා B ය. (02) B හා C ය.
(03) A හා C ය. (04) A , B හා C යන සියල්ලම ය.

(07) ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත හැක්කේ,

(01) අවස්ථා හා තර්ජනයන් ය. (02) ශක්තීන් හා දුර්වලතා ය.
(03) ශක්තීන් හා තර්ජනයන් ය. (04) අවස්ථා හා දුර්වලතා ය.

(08) රවිමල් පොල් ලෙලි වලින් ලබා ගන්නා කොහු භාවිතයෙන් පාපිසි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

මෙහි සඳහන් පොල් කොහු අයත් වනුයේ කුමන නිෂ්පාදන සාධකයටද?

(01) භූමිය (02) ප්‍රාග්ධනය (03) ශ්‍රමය (04) ව්‍යවසාය

(09) ඩොලරය මුදල් ඒකකයක් ලෙස භාවිත කරන රටවල් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(01) එක්සත් රාජධානිය , එක්සත් ජනපදය , කැනඩාව , චීනය.

(02) එක්සත් රාජධානිය , සිංගප්පූරුව . ඕස්ට්‍රේලියාව , කැනඩාව.

(03) එක්සත් ජනපදය . සිංගප්පූරුව , ඕස්ට්‍රේලියාව , කැනඩාව.

(04) එක්සත් ජනපදය . ඕස්ට්‍රේලියාව , කැනඩාව. චීනය.

(10) නිමල් සහ සුනිල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය තව දුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවක් ඇති වූ බැවින් ඔවුන් තම ව්‍යාපාරය සීමිත වගකීමක් සහිත ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු පනත වන්නේ,

(01) 1980 හවුල් ව්‍යාපාර ආඥා පනත (02) 1918 ව්‍යාපාර නාම ආඥා පනත

(03) 1840 අංක වංචා වැලැක්වීමේ පනත (04) 2007 අංක 07 දරණ සමාගම් පනත

(11) ව්‍යාපාර සංවිධාන වර්ග කීපයක් පහත දැක්වේ.

A - තනි ව්‍යාපාර B - හවුල් ව්‍යාපාර C - සීමිත සමාගම්

D - රාජ්‍ය සංස්ථා E - රාජ්‍ය සමාගම් F - රාජ්‍ය දෙපාර්තමේන්තු

මේවා අතුරෙන් නෛතික පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන ඇතුළත් පිළිතුර තෝරන්න.

(01)A , B හා C ය. (02) B , C හා D ය. (03) C , D හා E ය. (04) C , D හා F ය.

(12) කොටස් නිකුත් කිරීම මගින් ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(01) රාජ්‍ය සංස්ථා (02) සීමාසහිත සමාගම්

(03) හවුල් ව්‍යාපාර (04) රාජ්‍ය දෙපාර්තමේන්තු

(13) අමාත්‍යංශයක් යටතේ ක්‍රියාත්මක වන රජයේ සෘජු පාලනයට යටත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(01) රාජ්‍ය සමාගම් (02) රාජ්‍ය දෙපාර්තමේන්තු

(03) රාජ්‍ය සංස්ථා (04) ව්‍යවස්ථාපිත සමාගම්

(14) පෙරේරා සහ පුත්‍රයෝ, කෘෂි රක්ෂණ මණ්ඩලය , ජනසෙත පාඨක සමාජය යන ව්‍යාපාර අයත් වන ව්‍යාපාර සංවිධාන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(01) හවුල් ව්‍යාපාර , රාජ්‍ය සංස්ථා , රාජ්‍ය දෙපාර්තමේන්තු

(02) හවුල් ව්‍යාපාර , රාජ්‍ය දෙපාර්තමේන්තු, සමිති සංවිධාන

(03) ඒක පුද්ගල ව්‍යාපාර , රාජ්‍ය සංස්ථා , සමිති සංවිධාන

(04) හවුල් ව්‍යාපාර , රාජ්‍ය සංස්ථා, සමිති සංවිධාන

(15) ශ්‍රී ලංකාවේ ‘‘වගකීම සීමිත’’ ව්‍යාපාර සංවිධාන අඩංගු පිළිතුර තෝරන්න.

(01) සමුපකාර , හවුල් ව්‍යාපාර , පොදු සමාගම්

(02) කේවල ස්වාමී ව්‍යාපාර , හවුල් ව්‍යාපාර , සී / ස පොදු සමාගම්

(03) සී / ස පොදු සමාගම් , සී / ස පෞද්ගලික සමාගම් , සමුපකාර

(04) කේවල ස්වාමී ව්‍යාපාර , හවුල් ව්‍යාපාර , සමිති ව්‍යාපාර

(16) ව්‍යාපාර ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(01) සෑම ව්‍යාපාරයක්ම ලියාපදිංචි කිරීම තුළින් නීතිමය පුද්ගලභාවයක් ලැබීම.

(02) ව්‍යාපාර කටයුතුවල නිරත සියලුම ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්ය වීම.

(03) සමාගමක් සංස්ථාපනය කිරීම මගින් නීතිමය පුද්ගලභාවයක් හිමි වීම.

(04) ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවයක් හිමි වීම.

(17) ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී පදනම වන්නේ,

(01) මුදල් පොත (02) බැංකු ගිණුම

(03) ලෙජරය (04) ව්‍යාපාරික ගණුදෙනු හා සිද්ධීන්

(18) 2018.01.01 දිනට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
| 200000 | = | 150000 | + | 50000 |

රු. 25000/= ක භාණ්ඩ ණයට ගත් පසු ගිණුම්කරණ සමීකරණයේ අගයන් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| | වත්කම් | = | හිමිකම | + | වගකීම් |
| (01) | 250000 | = | 200000 | + | 50000 |
| (02) | 225000 | = | 175000 | + | 50000 |
| (03) | 225000 | = | 150000 | + | 75000 |
| (04) | 200000 | = | 150000 | + | 50000 |

- **පහත තොරතුරු ඇසුරෙන් අංක 19 - 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

උපුලිගේ ව්‍යාපාරයේ 2017.01.01දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 250000 | ණයහිමියෝ | 10000 |
| බඩුතොගය | 25000 | මුදල් ශේෂය | 15000 |
| ණයගැතියෝ | 30000 | කාර්යාල උපකරණ | 50000 |
| බැංකු ණය | 50000 | ලිබඩු | 30000 |

(19) 2017.01.01 දිනට උපුලිගේ ව්‍යාපාරයේ හිමිකම වන්නේ,

(01) රු. 240000 (02) රු. 330000 (03) රු. 340000 (04) රු. 460000

(20) ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල අගය වන්නේ,

(01) රු. 60000 (02) රු. 260000 (03) රු. 280000 (04) රු. 330000

(21) ව්‍යාපාරයේ ජංගම වගකීම්වල අගය වන්නේ,

(01) රු. 10000 (02) රු. 40000 (03) රු. 50000 (04) රු. 60000

(22) රු. 25000 ක බඩුතොගයක් ණයට ගැනීමට අදාළ බලපෑම ගිණුම්කරණ සමීකරණයේ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(01) වත්කමක් වැඩි වී වගකීමක් අඩුවීම. (02) වත්කමක් අඩුවී හිමිකම අඩුවීම.

(03) වත්කමක් වැඩිවී වත්කමක් අඩුවීම. (04) වත්කමක් වැඩිවී වගකීමක් වැඩිවීම.

(23) රු. 10000 ක චෙක්පතක් ණයගැතියන්ගෙන් ලැබීම සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(01) ණයගැති ගිණුම හර 10000
මුදල් ගිණුම බැර 10000

(02) මුදල් ගිණුම හර 10000
ණයගැති ගිණුම බැර 10000

(03) බැංකු ගිණුම හර 10000
ණයගැති ගිණුම බැර 10000

(04) ණයගැති ගිණුම හර 10000
බැංකු ගිණුම බැර 10000

(24) පහත X තීරුවේ ගිණුම් වර්ගයද Y තීරුවේ ලෙජර් ගිණුම් කීහිපයක්ද දැක්වේ.

| X | Y |
|---|---|
| (01) වත්කම් ගිණුම් | A විදුලිගාස්තු ගිණුම |
| (02) වගකීම් ගිණුම් | B මෝටර් රථ ගිණුම |
| (03) හිමිකම් ගිණුම් | C ගැනිලි ගිණුම |
| (04) ආදායම් ගිණුම් | D විකුණුම් ගිණුම |
| (05) වියදම් ගිණුම් | E ණයහිමි ගිණුම |

X තීරුවේ ගිණුම් වර්ග Y තීරුවේ ලෙජර් ගිණුම් සමග ගැලපූ විට අනුපිළිවෙලින් ලැබෙන පිළිතුර වන්නේ,

(01) B , E , C , A , D (02) B , A , D , C , E

(03) B , E , C , D , A (04) B , E , C , A , D

(25) අයිතිකරුගේ හිමිකම වෙනස් නොවීමට බලපාන ගනුදෙනුව කුමක්ද?

(01) රු. 2000 ක කොමිස්8 ආදායම් ලැබීම. (02) රු. 50000 ක අමතර ප්‍රාග්ධනය යෙදීම.

(03) රු. 3000 ක දුරකථන ගාස්තු ගෙවීම. (04) රු. 75000 ක බැංකු ණයක් ගැනීම.

(26) ගිණුම සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(01) ලෙජරයේ ගිණුම් වර්ග 05 ක් යටතේ හඳුනාගත හැකිය.

(02) ගිණුමක හර හා බැර ලෙස දෙපැත්තක් ඇත.

(03) සෑම ගනුදෙනුවකම බලපෑම, වැඩිවීම හරටත් අඩුවීම බැරටත් ගිණුම්වල සටහන් කෙරේ.

(04) ගිණුමක විස්තරය තීරුවේ සටහන් කරන්නේ අනෙක් සටහන තැබූ ගිණුමේ නමයි.

(27) **වැඩිවීම හර අඩුවීම බැර** යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපණය වන ගිණුම නොවන්නේ,

(01) ලද වට්ටම් ගිණුම (02) දුන් වට්ටම් ගිණුම

(03) ගැණුම් ගිණුම (04) මුදල් ගිණුම

(28) ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවක් ම ප්‍රථමයෙන්ම සටහන් කරනුයේ,

(01) ගිණුම්වල ය. (02) මූලික සටහන් පොත්වල ය.

(03) ලෙජරයේ ය. (04) මුදල් පොතේ ය.

(29) මූලාශ්‍ර ලියවිල්ලක ඇතුළත් නොවන්නේ මින් කුමක්ද?

(01) ව්‍යාපාරයේ නම හා ලිපිනය (02) අනුක්‍රමික අංකය

(03) සහල පිටුව (04) වගකිව යුතු නිලධාරියෙකුගේ අත්සන

(30) ණයහිමියෙකු වූ ටිංකා ට රු. 5000ක් මුදලින් ගෙවූ අතර ඊට අදාළ මූලික පොත A වන අතර මූලාශ්‍ර ලේඛණය B වේ.

ඉහත A හා B අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

(01) ගැණුම් ජර්නලය , වවුචරය (02) මුදල් පොත , ලදුපත

(03) වවුචරය , මුදල් පොත (04) මුදල් පොත , වවුචරය

(31) සෝමවීරගේ ව්‍යාපාරයේ 2017 වර්ෂයට අදාළ තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| වර්ෂය තුළ ගැනිලි රු. 5000 | වර්ෂය තුළ ඉපයූ ආදායම රු. 50000 |
| වර්ෂය තුළ වියදම් රු. 30000 | 2017.01.01 දිනට ප්‍රාග්ධනය රු. 250000 |

සෝමවීරගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට හිමිකම දැක්වෙන පිළිතුර වන්නේ,

(01) රු. 225000 (02) රු. 265000 (03) රු. 280000 (04) රු. 335000

(32) මුදල් පොත ඉටුකරන ද්විත්ව කාර්යය දැක්වෙන පිළිතුර වන්නේ,

(01) මූලික සටහන් පොතක කාර්යය හා ආදායම් ගිණුමක කාර්යය.

(02) ලෙජර් ගිණුමක කාර්යය හා මූලාශ්‍ර ලේඛණයක කාර්යය.

(03) මූලික සටහන් පොතක කාර්යය හා වත්කම් ගිණුමක කාර්යය

(04) වියදම් ගිණුමක කාර්යය හා මූලික සටහන් පොතක කාර්යය.

(33) පහත දැක්වෙන ද්විත්ව සටහනට අදාළ ගනුදෙනුව දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

ගැනිලි ගිණුම හර 5000

මුදල් ගිණුම බැර 5000

(01) ණයහිමියන්ට රු. 5000 ක් මුදල් ගෙවීම.

(02) ණයගැතියන්ගෙන් රු. 5000 ක් මුදල් ලැබීම.

(03) රු. 5000 ක භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

(04) රු. 5000 ක මුදල් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.

(34) මුදල් වට්ටම් සම්බන්ධව වැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(01) භාණ්ඩ මිලට ගැනීමේදී මෙන්ම විකුණන විටද මුදල් වට්ටම් ලබා දෙයි.

(02) මුදල් වට්ටම් ගිණුම්ගත කෙරේ.

(03) මුදල් වට්ටම් ඇතිවන්නේ ණය බේරුම් කරන විටය.

(04) මුදල් වට්ටම් දුන් වට්ටම් හා ලද වට්ටම් ලෙස වර්ග දෙකකි.

(35) පෙරේරාගේ ව්‍යාපාරය, සිල්වාට ගෙවිය යුතු රු. 5000 ක ණය පියවීමේදී 10% ක වට්ටමකට යටත්ව මුදල් ගෙවන ලදී. එම වට්ටම් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(01) දුන් වට්ටම් ගිණුම හර 500
ණයගැති ගිණුම බැර 500

(02) ණයහිමි ගිණුම හර 500
ලද වට්ටම් ගිණුම බැර 500

(03) ණයගැති ගිණුම හර 500
දුන් වට්ටම් ගිණුම බැර 500

(04) ණයහිමි ගිණුම හර 5000
ලද වට්ටම් ගිණුම බැර 5000

(36) මුදල් පොතේ ශේෂය සැම විටම ,

(01) බැර ශේෂයකි

(02) හර හෝ බැර ශේෂයකි

(03) හර ශේෂයකි

(04) ශේෂය බින්දුවක් කි.

(37) ද්විත්ව කාර්යයක් ඉටුකරන මූලික සටහන් පොත් දෙක වන්නේ.

(01) මුදල් පොත හා ගැනුම් ජර්නලය

(02) මුදල් පොත හා ලෙජරය

(03) මුදල් පොත හා පොදු ජර්නලය

(04) මුදල් පොත හා සුළු මුදල් පොත

(38) සුළු මුදල් පොත සම්බන්ධව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - සුළු මුදල් ගෙවීම් කිරීම සඳහා සුළු මුදල් ගෙවීම් වවුචරය මූලාශ්‍ර ලියවිල්ල ලෙස යොදා ගනී.

B - සුළු මුදල් භාරකරුට ලබාදෙන සුළු මුදල් අග්‍රිමය සෑම ව්‍යාපාරයකටම සමාන අගයකි.

ඉහත ප්‍රකාශ සම්බන්ධ නිවැරදි පිළිතුර වන්නේ,

(01) A හා B සත්‍ය වේ.

(02) A සත්‍යවන අතර B අසත්‍ය වේ.

(03) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(04) A හා B දෙකම අසත්‍ය වේ.

(39) සුළු මුදල් පොතේ ලෙජර් ගිණුම් තීරුවේ සටහන් කරන අයිතමයක් වන්නේ.

(01) සංග්‍රහ වියදම් ගෙවීම

(02) ණයහිමියන්ට ගෙවීම්

(03) සේවකයෙකු වූ නිමල්ට ගෙවූ ගමන් වියදම්

(04) විවිධ වියදම් ගෙවීම

(40) උදාරගේ ව්‍යාපාරයේ 2017.05.31 දිනට සුළු මුදල් වියදම්වල එකතුව රු. 1800 කි. එදිනට සුළු මුදල් ශේෂය රු. 200 කි. ජුනි 01 දින සිට සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් අඩු කිරීමට තීරණය කළේ නම් ජුනි 01 දින ප්‍රතිපූරණය කළ යුතු වටිනාකමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(01) සුළු මුදල් පොත හර 1800
මුදල් පොත බැර 1800

(02) මුදල් පොත හර 1300
සුළු මුදල් පොත බැර 1300

(03) සුළු මුදල් පොත හර 2100
මුදල් පොත බැර 2100

(04) සුළු මුදල් පොත හර 1300
මුදල් පොත බැර 1300